ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 2010

## 1.1 සමූහ මූල්‍ය ප්‍රකාශන

---------------------

"සීමාසහිත ජාතික ඉතිරි කිරීමේ බැංකු ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමේ" කොටස් ප්‍රාග්ධනයේ 100% අයිතිය ජාතික ඉතිරි කිරීමේ බැංකුව සතුවේ. 2010 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ආයොජන වල තත්ත්වය සහ ඉකුත් වර්ෂය අවසානයට තත්ත්වය පහත දැක්වේ.

| 2010 | | 2009 | |
|---|---|---|---|
| පිරිවැය | අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව | පිරිවැය | අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරුව |
| රු.000 | රු.000 | රු.000 | රු.000 |
| 150,000 | 150,000 | 150,000 | 150,000 |

## 1.2 බැංකුව සමඟ අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්

----------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 29 හි හෙළිදරව් කරන ලද කරුණු හැර , ලබාගතහැකි වු තොරතුරු අනුව බැංකුවේ අධ්‍යක්ෂකවරු බැංකුව සමඟ සෘජුව හෝ වක්‍රව කිසිදු බැඳීමක් ඇති කර ගෙන නොතිබුණි.

## 1.3 ඒකාබද්ධ අරමුදල හා පොදු සංචිතය සඳහා දායකත්වය

---------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව පසුගිය වර්ෂ 5 ක බැංකුවේ ශුද්ධ ලාභය සහ ඒකාබද්ධ අරමුදලට හා පොදු සංචිතයට කරන ලද දායකත්වය පහත දැක්වේ.

| වර්ෂය | ශුද්ධ ලාභය | ඒකාබද්ධ අරමුදලට දායකත්වය | | පොදු සංචිතයට දායකත්වය | |
|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | % | රු.000 | % |
| 2006 | 1,884,746 | 1,000,000 | 53 | 790,509 | 42 |
| 2007 | 1,573,074 | 1,250,000 | 79 | 957,086 | 61 |
| 2008 | 1,059,267 | 1,000,000 | 94 | 6,303 | 1 |
| 2009 | 3,714,231 | 1,750,000 | 47 | 1,778,520 | 48 |
| 2010 | 5,401,147 | 2,664,084 | 49 | 2,467,005 | 46 |

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

බැංකුවේ කොටස් හිමියන් ආශ්‍රයෙන් සලකන කළ 2010 දෙසැම්බර් 31 දිනට බැංකුව සහ එහි පරිපාලනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ ලාභය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

------------------------------

(අ) <u>ශ්‍රී.ලං.ගි.ප්‍ර.18</u>

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු.250,806,551 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ආ) <u>ශ්‍රී.ලං.ගි.ප්‍ර.36</u>

ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ලැබිය යුතු රු.34,600,000 ක් අසම්භාව්‍ය ස්වභාවයේ වත්කමක් වුවද , එය මූල්‍ය ප්‍රකාශන වල සටහන් යටතේ හෙළිදරව් කිරීමෙන් තොරව ශේෂ පත්‍රයට වත්කමක් ලෙස හඳුනා ගෙන තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැතැම් වීදියේ පිහිටි ශාඛාව 2009 ජනවාරි 19 දින ආරක්ෂක හේතූන්මත රජයට පවරා ගෙන තිබුණු අතර මෙම ගනුදෙනුව 2010 වර්ෂය තුළ සිදුව ගනුදෙනුවක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. රු.34,600,000 ක් වූ ඉඩමේ පිරිවැය ඉඩම් හා ගොඩනැගිලි මුළු පිරිවැයෙන් අඩුකර සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු වෙනත් ආදායම් ලෙස දක්වා තිබුණි. මෙම ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් සනාථ කිරීම් රජයෙන් ලැබී නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්‍රිය ගිණුම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.55,246,473 ක් හා රු.105,950,228 ක් පිළිවෙලින් වර්ෂ තුනකට හා වර්ෂ පහකට වැඩි කාලයක පරිශේෂව පැවතුණි.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට වංචනික ආපසු ගැනීම් රු.19,836,607 ක් පරිශේෂව පැවතුණි.

(ඇ) මුළු ණය හිමියන්ගෙන් 15% ක් නියෝජනය වූ එකතුව රු.2,322,881 ක මුළු ණයහිමි (ගිණුම් සංකේත 66103 ) ශේෂයන් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ දෙකකට වැඩි කාලයක් පරිශෙෂව පැවතුණි. තවද රු.4,427,603 ක් වූ විවිධ ණය හිමි ශේෂ වර්ෂ 1 සිට 2 දක්වා වූ කාල පරිච්ජේදයක් පරිශේෂව පැවතුණි.

(ඈ) ශාඛා වලට අදාල රු.57,589 ක් වූ විවිධ ණය හිමියන් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ තුනකට වැඩි කාලයක් පරිශේෂව පැවතුණි.

(ඉ) හිමිකම් නොපෑ ශේෂ වලින් 41% ක් නයෝජනය වූ රු.219,016 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් පරිශේෂව පැවතුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාල පරිදි කාල විශ්ලේෂණ , ගිවිසුම් සහ සත්‍යෙක්ෂණ වාර්තා වැනි ලිඛිත සාක්ෂි නොවීම හේතුවෙන් විෂයයන් 9 කට අදාල එකතුව රු.1,789,000,334 ක් වූ ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුනක නිකුත් කරන ලද විගණන විමසුම් 119 කින් 2011 ජුනි 30 දක්වා ඉකුත් වර්ෂ 2 කදී නිකුත් කරන විගණන විමසුම් 71 කින් 9 ක්ද ඇතුළත්ව විගණන විමසුම් 33 කට පිළිතුරු සපයා නොතිබුණි.

### 2.2.5 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 84(3) වගන්තිය | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විනය කළමනාකරණයට අදාල රීති ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොතිබුණි. |
| (ආ) | 2007 අංක 10 දරන පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | ගිණුම් විවෘත කිරීමේදී ඉල්ලුම්පත්‍රයන් සමඟ ඉදිරිපත් කළ යුතු බදු ප්‍රකාශ කිරීමේ ප්‍රකාශන ශාඛා 11 ක් විසින් අවස්ථා 103 කදී ගනදෙනුකරුවන්ගෙන් ලබාගෙන නොතිබුණි. |
| **(ඇ)** | **මුදල් රෙගුලාසි** | |
| | (i). මුදල් රෙගුලාසි 104 | මෝටර් රථ 25 කට අදාළව සිදුවූ අනතුරු සඳහා මූලික හා අවසාන වාර්තා පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii). මුදල් රෙගුලාසි 756 | ශාඛා 56 කට සහ අංශ 25 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii). මුදල් රෙගුලාසි 1646 | මෝටර් රථ 46 කට අදාලව මාසික කාර්ය සාධන වාර්තා හා දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි 135 (5) (අ) (ආ) සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.8 වගන්තිය | බැංකුවේ මූල්‍ය පාලන බලතල පැවරීම් එක් එක් වර්ෂය ආරම්භයේදී යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඉ) 2006 ඔක්තෝබර් 05 දින අංක 6 න් සංශෝධිත ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ 2006 ජනවාරි 25 දිනැති ජාතක ප්‍රසම්පාදන මාර්ගෝපදේශ චක්‍රලේඛය | |
| (i). 2.14.1 සහ 3.4 පරිච්ඡේදය | විවෘත තරඟකාරී ලංසු පරිපාටිය අනුගමනය කිරීම වෙනුවට වෙළඳ මිල සැදැහුම් ක්‍රමය යටතේ බැංකුවේ බාහිර ආරක්ෂක සේවාව රු.මිලියන 45 ක පිරිවැයකට තෝරා ගෙන තිබුණි. |
| (ii). 3.2 වගන්තිය | රු.මිලියන 2 කට වැඩි වටිනාකම ඇති භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී විවෘත තරඟකාරී ලංසු පරිපාටිය අදාල කර ගත යුතු වුවද පහත දැක්වෙන මිලදී ගැනීම් වලදී වෙළඳ මිල සැදැහුම් ක්‍රමය පමණක් අනුගමනය කර තිබුණි.<br><br>(i) තැපැල් කාර්යාල සඳහා Point of Sale (Pos) Terminals 50 ක් රු.4,335,575 ක පිරිවැයකට මිලදී ගැනීම.<br><br>(ii) බැංකුවේ පියස ශාඛා 15 ක් සඳහා රු.2,472,885 ක පිරිවැයකට ලී බඩු මිලදී ගැනීම. |

| | | |
|---|---|---|
| | (iii). 5.3.2 , 6.2.2 වගන්ති | රු.33,750,000 ක පිරිවැයකට " විස්ට්ලින් කේතල් " 50,000 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව ලංසු සඳහා දිය යුතු දින 21 ක කාලය වෙනුවට දින 17 ක කාලයක් පමණක් ලබාදී තිබුණි. |
| | (iv). 4.2.1 වගන්තිය | 2010 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. |
| (ඊ) | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ අංක 445/1998 දරන චක්‍රලේඛය | ශාඛාවක පරිගණක කටයුතු සම්බන්ධයෙන් කළමනාකරණ බලතල එක් නිලධාරියෙකුට පැවරිය යුතු වුවද , ශාඛා 6 ක් සම්බන්ධයෙන් එම බලතල නිලධාරීන් කිහිපදෙනෙකුට පවරා තිබුණි. |
| (උ) | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ අංක 681/2007 දරන චක්‍රලේඛය | (i) බැංකුවේ ශාඛාවන් 14 ක් විසින් ගිණුම් 255 ක විවෘත කිරීමේදී එක් එක් ගනුදෙනුකරුගේ ජාතික හැඳුනුම්පතේ සහ උප්පැන්න සහතිකයේ පිටපතක් ලබාගෙන නොතිබුණි.<br>(ii) ගිණුම් විවෘත කිරීම සඳහා වු ඉල්ලුම් පත්‍රය සමඟ "ඔබගේ ගණුදෙනුකරු හඳුනාගන්න" (KYC) ආකෘති පත්‍ර ශාඛා 9 ක් විසින් අවස්ථා 79 කදී ලබාගෙන නොතිබුණි. |
| (ඌ) | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමාන්‍යාධිකාරීගේ අංක 769/2010 දරන චක්‍රලේඛය | දින 10 කට වැඩි කාලයක් භාවිතා නොකළ සියලුම "පාස්වර්ඩ්ස්" (Passwords ) ශාඛා කළමනාකරු විසින් වලංගු නැති කළ යුතු වුවද ශාඛා 9 ක කළමනාකරුවන් විසින් මෙම උපදෙස් වලට අනුකූල වී නොතිබුණි. |

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව බැංකුවේ වැඩ කටයුතු වලින් සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රතිඵලය රු.මිලියන 9,788 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ රු.මිලියන 6,944 ක බදු පෙර ශුද්ධ ලාභය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 2,844 කින් එනම් 41% කින් වැඩිවීමක් දැක්වුණි. මෙම වැඩිවීම සඳහා වඩාත් දායකවූ කරුණ වන්නේ රු.මිලියන 1,583 ක් වූ ආයෝජන ඇපකර වලින් ලද ලාභයයි.

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ පරිපාලිතයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 435 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.මිලියන 1,115 ක් වූ බදු පෙර ශුද්ධ ලාභය සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 680 කින් අඩුවීමක් දැක්වුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 9,788 ක් වූ බදු පෙර ශුද්ධ ලාභය තුළ ප්‍රධාන කාර්යාලයේ රු.මිලියන 4,695 ක් වූ ලාභය ද ශාඛා 145 ක ( බැංකු ශාඛා , තැපැල් ශාඛා , පියස ඒකක හා අංශ ) රු.මිලියන 5,281 ක ලාභයද , රු.මිලියන 188 ක් වූ බැංකු ශාඛා 47 ක අලාභයද ඇතුළත්වී තිබුණි.

(ආ) බැංකුවේ සමුච්චිත ආදායම රු.මිලියන 904 කින් අඩුවී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමුච්චිත ආදායම හා සැසඳීමේදී 1.8% ක අඩුවීමක් දැක්වුණි.

(ඇ) නව තොරතුරු තාක්ෂණ පද්ධතිය සඳහා බැංකුව විසින් රු.250,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීම් යටතේ මෙය ගෙවිය යුතු ලෙස දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.2 වැදගත් අනුපාත හා ප්‍රතිශත

-------------------------------

ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ බැංකුවේ වැදගත් අනුපාත පහත දැක්වේ.

| | | 2010 | 2009 % |
|---|---|---|---|
| (අ) | <u>ලාභදායිත්ව මට්ටම</u> | | |
| | i. ශුද්ධ පොලී ආන්තකය | 32.43 | 28.62 |
| | ii. හිමිකම් මත ප්‍රතිලාභ | 26.36 | 20.91 |
| (ආ) | <u>ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය</u> | | |
| | හිමිකම / මුළු වත්කම් | 0.05 | 0.05 |
| (ඇ) | <u>ද්‍රවශීල වත්කම්</u> | | |
| | තැන්පතු / ණය හා අත්තිකාරම් | 4.35 | 4.58 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ පොලී ආන්තිකය හා හිමිකම් මත ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස ඉහල ගොස් තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ ණය සහ අත්තිකාරම් වලට තැන්පතු ස්වල්ප වශයෙන් පහළ ගොස් තිබුණි.

## 3.3 ශාඛා කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය තුළ බැංකු ශාඛාවන්හි කාර්ය සාධනය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | | 2010 | 2009 |
|---|---|---|---|
| (අ) | ශාඛා සංඛ්‍යාව | 186 | 126 |
| (ආ) | ඉතුරුම් හල් සංඛ්‍යාව | - | - |
| (ඇ) | තැපැල් ඉතුරුම් ශාඛා සංඛ්‍යාව | 19 | 19 |
| (ඈ) | තැපැල් කාර්යාල සංඛ්‍යාව | 4,053 | 4,055 |
| (ඉ) | ගිණුම් හිමියන් සංඛ්‍යාව (මිලියන) | 16.7 | 16.3 |
| (ඊ) | ඉලෙක්ට්‍රොනික ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 191 | 148 |
| (උ) | පියස සංඛ්‍යාව ( ඒකක ) | - | 19 |
| (ඌ) | පාසැල් බැංකු ඒකක සංඛ්‍යාව | 373 | 262 |

සමාලෝචිත වර්ෂය තුළ නව ශාඛා 60 ක් විවෘත කර ඇති අතර තැපැල් කාර්යාල හා පියස ඒකක 19 ක් ශාඛා ලෙස පරිවර්තනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ගිණුම් හිමියන් සංඛ්‍යාව මිලියන 0.4 කින් ඉහළ යාම හා ඉලෙක්ට්‍රොනික ටෙලර් යන්ත්‍ර 148 සිට 191 දක්වා ඉහළ යාම හේතුවෙන් බැංකුවේ මෙහෙයුම් කටයුතු වල සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි.

## 3.4 කල්පිරීමේ ක්‍රියාවලිය

----------------------

වත්කම් වල හා වගකීම්වල කල්පිරීමේ රටාව පහත පරිදි විය.

| | මාස 03 දක්වා | මාස 3-12 | වර්ෂ 1-3 | වර්ෂ 3-5 | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **වත්කම්** | | | | | |
| පොලී උපයන | 55,830 | 94,084 | 134,239 | 52,419 | 39,603 |
| පොලී නොඋපයන | 9,780 | 11,485 | 284 | 53 | 5,453 |
| | 65,610 | 105,569 | 134,523 | 52,472 | 45,056 |
| **වගකීම්** | | | | | |
| පොලී උපයන | 196,587 | 160,474 | 6,259 | 3,209 | - |
| පොලී නොඋපයන | 5,783 | 7,523 | 2,635 | 246 | 20,515 |
| | 202,370 | 167,997 | 8,894 | 3,455 | 20,515 |
| ද්‍රවශීලතා පරතරය | (136,760) | (62,428) | 125,629 | 49,017 | 24,541 |

මාසික මට්ටමින් බැංකුවේ වත්කම් හා වගකීම් කල්පිරීමේ විශ්ලේෂණයට අනුව මුළු වගකීම් ප්‍රමාණය වත්කම් වලට වඩා විශාල බව අනාවරණය වු අතර 2010 වර්ෂයේදී කෙටි කාලීන ද්‍රවශීලතා පරතරය මාස 3 දක්වා සහ මාස 3-12 දක්වා පිළිවෙලින් රු.මිලියන 136,760 සහ රු.මිලියන 62,428 ක ඍණ අගයක් ගෙන තිබුණි.

## 3.5 ණය පරිපාලනය

-------------------

3.5.1 සමාලෝචිත වර්ෂය අවසානයට ලබාදුන් ණය සහ අත්තිකාරම් වල තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| ණය පහසුකම | ගිණුම් සංඛ්‍යාව | | ගෙවන ලද වටිනාකම | |
|---|---|---|---|---|
| | 2010 | 2009 | 2010 (රු.මිලියන) | 2009 (රු.මිලියන) |
| නිවාස හා දේපල ණය | 8,003 | 3,536 | 7,722 | 3,482 |
| උකස් ණය | 990,790 | 551,459 | 36,185 | 15,324 |
| පෞද්ගලික ණය | 2,090 | 4,396 | 283 | 357 |
| ව්‍යාපෘති ණය | 1 | 12 | 1,638 | 5,185 |
| වාහන ණය | 45 | 5 | 55 | 8 |
| ශ්‍රී ලංකා රජයට ලබාදුන් ණය | 1 | 2 | 280 | 6,570 |
| එකතුව | 1,000,930 | 559,410 | 46,163 | 30,926 |

ඉකුත් වර්ෂය සමග සැසදමේ දී පෞද්ගලික ණය ගිණුම් හා ව්‍යාපෘති ණය ගිණුම් සංඛ්‍යාව පිළිවෙලින් 2,306 කින් එනම් 52% කින් සහ 11 කින් එනම් 92% කින් සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි.

### 3.5.2 රු.මිලියන 80 ක පිරිවැයකට නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘති ණය ලබාදීම

මෙම ගනදෙනුව පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිවාස යෝජනා ක්‍රමයක් සඳහා රු.මිලියන 80 ක් වු ඉහත ණය වියපැහැදම් දෙකකින් ලබාදී තිබුණි. ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදය ඉක්මවීම දක්වා කිසිදු වාරිකයක් හෝ පොලියක් ගෙවා නොතිබුණි.

(ආ) වෙන්දේසියේදී දේපල මිලදී ගැනීමට ගනදෙනුකරුවන් නොවු බැවින් බැංකුව විසින් දේපල භාර ගෙන තිබුණි.

(ඇ) අක්කර 2 රූඩ් 3 සහ පර්චස් 31.7 ක ප්‍රමාණයෙන් වු මෙම දේපලහි වටිනාකම රු.මිලියන 184 ක් වු අතර මෙම ඉඩම මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රු. මිලියන 130 ක් පමණක් ගෙවා තිබුණි. රු.මිලියන 50 ක පහසුකමක් සඳහා මෙම දේපල වෙනත් බැංකුවකට උකස් කර තිබු අතර වෙන්දේසියෙන් ලැබෙන මුදල 8.5 අනුපාතය පදනම් කර ගෙන බෙදා ගැනීමට බැංකු දෙකම එකඟවී තිබුණි.

(ඇ) නිවාස යෝජනා ක්‍රමයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මිලදී ගන්නා ලද නිවාස 35 අතුරෙන් නිවාස 5 ක් සඳහා තුන්වන පාර්ශ්වයන් විසින් නඩු පවරා තිබුණි. ඉහත නිවාස 5 පිළිබඳව උසාවි නියෝගය ප්‍රකාරව බැංකුව විසින් රු.මිලියන 9.7 ක් ගෙවා තිබු අතර මේ සම්බන්ධයෙන් බැංකුව ලද ශුද්ධ මුදල රු.මිලියන 70.3 ක් වු අතර ඒ හේතුවෙන් බැංකුවට සිදුවු පාඩුව රු.මිලියන 42.9 ක් විය.

(ඉ) 2009 ජුනි මාසයේදී රු.මිලියන 13.3 ක් වටිනාකම වු ඉඩමක් රජයට පවරා ගෙන තිබු අතර මෙම ගනදෙනුව සඳහා කිසිදු ගෙවීමක් බැංකුවට ලැබී නොතිබුණි.

(ඊ) සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා වෙනත් බැංකුවකට එහි වටිනාකමේ කොටසක් වශයෙන් රු.මිලියන 2.1 මුදලක් ගෙවීම මත ඉඩමකින් කොටසක් බැංකුව විසින් ලබාගෙන තිබුණි. එසේ වුවද සංචාරක බංගලාව ඉදිකිරීම සඳහා බැංකුව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

### 3.5.3 **අක්‍රීය ණය**

------------

ලබාගත හැකි වු තොරතුරු අනුව මුළු අක්‍රීය ණය ප්‍රමාණය , ණය පාඩු සඳහා වෙන් කිරීම හා අවිනිශ්චිත පොලි ප්‍රමාණය පහත දැක්වේ.

| **ණය වර්ගය** | **මුළු හිඟ ණය** | **අක්‍රීය ණය ප්‍රමාණය** | **ණය පාඩු වෙන්කිරීම** | **අවිනිශ්චිත පොලිය** |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| නිවාස හා දේපල ණය | 33,215 | 2,046 | 504 | 203 |
| සංවර්ධන මුල්‍ය ණය | 6,018 | 9 | 90 | - |
| පෞද්ගලික ණය | 660 | 63 | 33 | 12 |
| වෙනත් | 42,446 | 1 | 5 | 2 |
| | 82,339 | 2,119 | 632 | 215 |

### 3.5.4 **ණය පාඩු සඳහා වෙන් කිරීම**

-----------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ණය පාඩු සඳහා වෙන්කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාල පරිච්ඡේදය | මූලික හිඟ ණය ශේෂ සඳහා වෙන්කිරීම | | හිඟ ණය ශේෂය | | වෙන්කිරීම | |
|---|---|---|---|---|---|---|
| | 2010 | 2009 | 2010 | 2009 | 2010 | 2009 |
| | % | % | රු. | රු. | රු. | රු. |
| මාස 6-12 | 0.97 | 0.78 | 372,017,000 | 538,656,489 | 3,614,000 | 4,181,409 |
| මාස 12-18 | 5.28 | 9.14 | 141,438,000 | 102,005,095 | 7,471,000 | 9,319,338 |
| මාස 18 ට වැඩි | 13.86 | 25.2 | 218,179,000 | 114,539,249 | 30,239,000 | 29,085,185 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 මැයි 04 දින වෙන්දේසි කරන ලද ඉඩම සඳහා ලැබුණු රු.1,861,382 ක් වූ තැන්පතු විවිධ ණයහිමි අවිනිශ්චිත ගිණුමෙහි ඇතුළත් කර තිබුණි. මෙම දේපල සම්බන්ධයෙන් වූ උසාවි නඩුවක් පවතින බැවින් මෙම වාර්තාවේ දිනය දක්වා මෙම මුදල නිරවුල් නොකර පැවතුණි.

(ආ) 2000 සිට 2009 කාල පරිච්ඡේදය තුළ නිවාස ණය 8 කට හා ව්‍යාපෘති ණයකට අදාලව බැංකුව විසින් භාර ගන්නා ලද වත්කම් වල වටිනාකම රු.14,932,216 ක් බව නිරීක්ෂණය විය. තවදුරටත් ගත් ක්‍රියාමාර්ග වාර්තා නොවීය. තවද ණය ගිණුම් තුනකට අදාල උසාවි නඩු, තීන්දුව සඳහා පවතින බව නිරීක්ෂණය විය.

## 3.6 මෙහෙයුම් සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.6.1 "ස්මයිල්" (SMILE) ගිණුම පිළිබඳ විකුණුම් ප්‍රවර්ධන කටයුතු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2010 ඔක්තෝබර් 31 දින හඳුන්වා දෙන ලද "ස්මයිල්" නමැති නව ඉතිරි කිරීමේ ගිණුමේ ප්‍රධාන අරමුණු වයේ ග්‍රාමීය ජනතාව අතර ඉතිරි කිරීම් සංවර්ධනය, දේශීය ඉතිරි කිරීම් ප්‍රතිශතය වැඩි කිරීම තැන්පත්කරුවන්ට වඩාත් ප්‍රතිලාභී ඉතිරි කිරීමේ ගිණුම් හඳුන්වාදීමයි. බැංකුව මෙම නව ඉතිරි කිරීම් නිපැයුම මගින් 2011 වර්ෂය තුළදී රු. බිලියන 4 ක තැන්පතු වටිනාකමක් අත්කර ගැනීමට ඉලක්ක කර ඇත.

(අ) බැංකු සාමාන්‍යාධිකාරීගේ අංක 750 / 2009 දරන චක්‍රලේඛයට අනුව නව නිපැයුම් හඳුන්වාදීමේදී විශේෂිත මගපෙන්වීම් අනුගමනය කළ යුතු අතර බැංකුවේ නව නිපැයුම් සංවර්ධනය සඳහා නිපැයුම් සංවර්ධන කමිටුව (PDC) වගකිව යුතු වේ. කෙසේ වුවද "ස්මයිල්" ඉතිරි කිරීමේ ගිණුම හඳුන්වාදීමේදී එම මග පෙන්වීම් බැංකුව විසින් අනුගමනය කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2008 අගෝස්තු 26 දින හඳුන්වා දෙන ලද "හැපී සේවින්ස් " ( Happy Savings ) ගිණුමට පසුව "ස්මයිල්" ඉතිරි කිරීමේ ගිණුම හඳුන්වා දෙන ලද අතර පසුගිය වර්ෂ දෙක තුළ වෙනත් කිසිදු ගිණුමක් හඳුන්වාදී නොතිබුණි.

## 3.7 ආර්ථික නොවූ ගනුදෙනු

**ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මහල් 18 ක ගොඩනැගිල්ල**

2006 වර්ෂයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා මහල් 18 කින් යුත් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පාලක මණ්ඩලය අනුමත කර තිබුණු නමුත් රජය විසින් අධි ආරක්ෂක කලාපයක් ලෙස නම් කරනු ලැබූ ස්ථානයක ගොඩනැගිලි වැඩි බිම පිහිටා තිබූ හෙයින් 2007 සැප්තැම්බර් 21 දින පාලක මණ්ඩලය විසින ගනු ලැබූ තීරණයක අනුව ඉදිකිරීම තාවකාලිකව නතර කරන ලදි. එබැවින් ව්‍යාපෘති කටයුතු සඳහා දරන ලද රු.35,228,367 ක වියදම ඵල රහිත වියදමක් ලෙස හඳුනාගෙන තිබුණි.

## 3.8 ආයෝජන මත ප්‍රතිලාභ

(අ) 2010 දෙසැම්බර් 31 දිනට උපාය මාර්ගික ආයෝජන වල පිරිවැය සහ ප්‍රතිලාභ පහත දැක්වේ.

| උපාය මාර්ගික ආයෝජන | ආයෝජන පිරිවැය | ප්‍රතිලාභ | ආයෝජන මත ප්‍රතිලාභ |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| හැටන් නැෂනල් බැංකුව | 1,106,777,575 | 31,479,255 | 2.84 |
| ශ්‍රී ලංකා ටෙලිකොම් | 445,642,518 | 2,960,708 | 0.66 |
| | 1,552,420,093 | 34,439,963 | |

හැටන් නැෂනල් බැංකුවෙහි සහ ශ්‍රී ලංකා ටෙලිකොම්හි ආයෝජන මත ප්‍රතිලාභ පිළිවෙලින් 2.84% ක් 0.66% ක් ලෙස දැක්වුණි. එබැවින් ඉහත උපාය මාර්ගික ආයෝජන සඳහා ආයෝජන මත සමස්ථ ප්‍රතිලාභය 2.22% ක් පමණක් වූ අතර 2010 වර්ෂය තුළදී බැංකුවට අඩු ප්‍රතිලාභයක් ලැබී ඇති බව එයින් දැක්වේ.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට රු.5,323,778,529 ක මුදලක් සමාගම් 50 ක කොටස් වල ආයෝජනය කර තිබුණද රු.1,835,081,390 ක මුදලක් ආයෝජනය කරන ලද සමාගම් 27 කින් ලාභාංශ ලැබී නොතිබුණි. මිල ප්‍රකාශිත සමාගම් වල මුළු ආයෝජන පිරිවැය සමඟ සැසඳීමේදී එම ආයෝජන පිරිවැය 34.47% ක් නියෝජනය විය.

(ඇ) සමාගම් 17 ක ආයෝජනය කරන ලද රු.1,462,468,337 කට අදාලව ලාභාංශ ලැබී නොතිබුණි. එය මුළු ආයෝජනයෙන් 27.47% ක් නියෝජනය විය.

(ඈ) බැංකුවේ මුළු ආයෝජන වලින් 10.67% ක් නියෝජනය වූ රු.567,965,955 ක මුදලක් බැංකුව විසින් ඉන්දියන් ඔයිල් සමාගමේ ආයෝජනය කර තිබුණි. 2008 , 2009 හා 2010 වර්ෂ සඳහා මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය. මෙම කාල පරිච්ඡේදය තුළද ආයෝජන මත ප්‍රතිලාභය ශූන්‍ය අගයක් ලෙස වාර්තා විය.

(ඉ) 2009 හා 2010 වර්ෂ සඳහා ආයෝජන වලට අදාලව ලැබුණු ලාභාංශ පිළිවෙලින් රු.48,183,938 ක් හා රු.88,250,954 ක් වූ අතර එනම් මුළු ආයෝජනයෙන් පිළිවෙලින් 2.21% ක් හා 1.66 % ක් නියෝජනය විය.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 වගන්තිය ප්‍රකාරව වර්තමාන කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණ.

(ආ) පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය සහ 2010 දෙසැම්බර් 31 දිනට බැංකුවේ තථ්‍ය කාර්ය මණ්ඩලය පහත වගුවෙන් දැක්වේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 558 | 498 | 83 | 23 |
| අධීක්ෂණ ශ්‍රේණි ( විධායක නොවන ) | 1,156 | 860 | 296 | - |
| මාණ්ඩලික නොවන ශ්‍රේණි | 1,525 | 1,474 | 445 | 394 |
| කනිෂ්ඨ ශ්‍රේණි | 317 | 218 | 100 | 1 |
| | 3,556 | 3,050 | 924 | 418 |

(i) අනුමත කාර්ය මණ්ඩලයට අනුව කළමනාකරණයේ විධායක මට්ටම නිලධාරීන් 558 ක් ගෙන් සමන්විත විය. කෙසේ වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනමින් පත් කරන ලද නිලධාරීන් 8 ක් ඇතුළත්ව නිලධාරීන් 498 ක් විය. තවද පුරප්පාඩු 83 ක් පැවති අතර උසස්වීම් ප්‍රමාදවීම හේතුවෙන් අතිරික්තතා 23 ක් පැවතුණි.

(ii) විධායක ශ්‍රේණියේ ඉහළ මට්ටමේ කළමනාකරණය බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලයෙහි විශේෂ ශ්‍රේණිය හා 1 ශ්‍රේණි මට්ටම නියෝජනය විය. බැංකුවේ විශේෂ ශ්‍රේණියේ පවත්නා කාර්ය මණ්ඩලය නිලධාරීන් 21 ක ගෙන් සමන්විත වු අතර එයින් 3 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. තවද බැංකුවේ 1 ශ්‍රේණි මට්ටමේ පවත්නා කාර්ය මණ්ඩලය නිලධාරීන් 44 ක් වු අතර අතර 5 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. කෙසේ වුවද ඉහත ඉහළ මට්ටමේ කළමනාකරණයට අදාළව පුරප්පාඩු තනතුරු 14 ක් 2010 දෙසැම්බර් අවසානය දක්වා බඳවා ගැනීමෙන් තොරව පැවතුණි.

(iii) අනුමත බැංකු සහකාර තනතුරු 920 ක් පමණක් වුවද බැංකුව විසින් බැංකු සහකරුවන් 1,047 ක් ස්ථිර පදනම මත හා 259 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අතර ඒ අනුව බැංකු සහකරුවන් 386 ක් අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව බඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සාමාන්‍යාධිකාරීගේ වාහනයේ දුර්වල නඩත්තු කිරීම හේතුවෙන් ප්‍රවාහන කළමනාකරු ප්‍රවාහන අංශයේ සිට පරිපාලන අංශයට මාරුකර තිබුණි. තවද ප්‍රවාහන කළමනාකරුගේ තනතුරු නාමය ප්‍රවාහන කළමනාකරු ( කාර්මික ) ලෙස මාරු කර තිබු අතර ඔහුගේ පරිවාස කාලය වර්ෂයකින් දීර්ඝ කර තිබුණි.

(i) තනතුරු නාමය වෙනස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ii) මේ අතර නිලධාරීන් දෙදෙනෙකුට ප්‍රවාහන අංශයේ කළමනාකරු තනතුරු ලෙස 2009 දෙසැම්බර් සිට 2010 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය තුළ කාර්ය භාර්යන් පවරා තිබුණු අතර අතිරේක නිලධාරියාට වැටුප් හා දීමනා ලෙස කාල පරිච්ඡේදය තුළදී ගෙවා තිබුණු මුදල රු.1,192,969 ක් විය.

## 3.10 බැඳීම් සහ අසම්භාව්‍යයන්

---------------------------

බැංකුව විසින් විවිධ වර්ගයේ නීතිමය කටයුතු සඳහා මැදිහත් වී තිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනට විසඳී නොමැති නඩු ප්‍රමාණය 35 ක් විය.

## 3.11 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

--------------------------------------------

(අ) සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ ඇතැම් ඉලක්ක සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාර සැලැස්මේ දක්වා තිබූ ඇතැම් ඉලක්ක සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගෙන නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය
(ඇ) ණය පරිපාලනය
(ඈ) ඉන්වෙන්ට්‍රි පාලනය
(ඉ) ලියකියවිලි පැවැත්වීම
(ඊ) ණයගැතියන් හා ණය හිමියන්
(උ) නීති , රීති හා රෙගුලාසි වලට අනුකූලවීම
(ඌ) ස්ථාවර වත්කම්
(එ) ගිණුම් විවෘත කිරීම හා වසා දැමීම
(ඒ) පරිගණක කටයුතු